"රහසයායි"                                   - කෙටුම්පත -

මගේ අංකය : SPLG/GL/A/KARPS/5/23/38

ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මතය**

------

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණයන් සඳහා ඉදිරිපත් කරනු ලබන පිළිතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව විගණන මතය තීරණය කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

## 2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

---

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) පී.එස්.17 (161 වන රීතිය) ප්‍රකාරව ආදායම් හා වියදම් ගිණුම (මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,112,907 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මහජ්දණ්ඩ හීනගහතොට මාර්ගය තාර දැමීමේ කර්මාන්තය වෙනුවෙන් ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.219,778 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට යක්කටුව ක්‍රීඩාංගනයේ අළුතින් වැට ඉදිකිරීමේ කර්මාන්තය සඳහා දරා තිබුණු රු.74,500 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කල නොහැකි යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා මිලදී ගෙන තිබුණු රු.51,890 ක් වටිනා අමතර කොටස් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වැටුප් හා දීමනා වලට අදාළ ණයහිමි ප්‍රතිපාදන රු.19,357 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය සඳහා ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා සඳහා ගෙවිය යුතු ණයහිමි ප්‍රතිපාදන රු.11,235 ක් අඩුවෙන් සලසා තිබීම නිසා සමුච්චිත අරමුදල රු.11,235 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.12,702,185 ක ශේෂය වෙනුවෙන් ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් 25 ක් සහ ගොඩනැගිලි 20 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ දී වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු රු.139,182 ක සේවක ණය ගෙවීම, සේවක ණය ගිණුමෙන් ඉවත් නොකිරීම, ජර්නල් සටහන් 17 මගින් නිවැරදි කිරීමේ දී සේවක ණය ගිණුමට හර කර, අවිනිශ්චිත ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා සමුච්චිත අරමුදල රු.139,182 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට සකස් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කල රු.55,500,000 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ගෙවීම් ලෙස දැක්විය යුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී මුදලින් ලද ප්‍රාග්ධන ලැබීම් රු.17,262,900 ක් වුවද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ප්‍රාග්ධන ලැබීම් රු.1,217,944 ක් ලෙස සටහන් කිරීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.16,044,955 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ මුදලින් දරන ලද ප්‍රාග්ධන වියදම රු.19,327,410 ක් වුවද, ආයෝජන ක්‍රියාකාරම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ප්‍රාග්ධන වියදම් රු.21,059,440 ක් ලෙස සටහන් කිරීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,732,030 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.13,287,445 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| --------- | ------------ | ------------------------ |
| | රු. | |
| පෙර ගෙවුම් | 151,810 | විස්තරාත්මක උපලේඛන |
| හිඟ හිටි වෙළඳ බලපත්‍ර | 123,350 | |
| ලැබිය යුතු පොළ බදු | 176,439 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ - (ඉදිරියට ගෙනා ශේෂය) | 11,178,044 | උපලේඛන |
| ලී බඩු හා සවිකිරීම් ( ඉදිරියට ගෙනා ශේෂය) | 1,657,802 | |
| | -------------- | |
| | 13,287,445 | |
| | ======== | |

## 2.4 ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂය තුළ රු.226,224 ක වටිනාකමින් යුතු වර්ෂ 02 ක් ඉක්ම වූ ණයගැති ශේෂයක් ඇතුළත්ව තිබුණි.

## 2.5 අනුකූල නොවීම්

-------------------

### 2.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | ------------------------------ | ------------ | ------------------- |
| | | **රු.** | |
| **(අ)** | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | |
| | (i) 24 වන වගන්තිය | 24,893,945 | සභාව සතු මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව 2020 වර්ෂය වන විට කි.මී.513.42 ක් වන මාර්ග 417 ක් නඩත්තු කර, ලේඛනයට ඇතුළත් කර තිබුණු අතර, 2020 වර්ෂයට පසුව රු.24,893,945 ක වියදමින් ඉදිකරන ලද කි.මී.4.151 ක් වන මාර්ග 23 ක් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 07 – 2023 නොවැම්බර් 03 දින) |
| | (ii) 100 වන වගන්තිය | - | 2022 හා 2023 වර්ෂයන් හි සභාව වෙත ලැබී තිබූ මහජන පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 14 - 2023 නොවැම්බර් 03 දින) |
| | (iii) 132(ඒ) වගන්තිය | 150,000 | ආගමික කටයුත්තක් සඳහා එක් වර්ෂයකට රුපියල් දහසක් නොඉක්මවන පරිදි සභා අරමුදලින් ගෙවීම් කළයුතු නමුත්, ඊට අනුකූල නොවන පරිදි සභා බල ප්‍රදේශයේ පෙරහැර කටයුත්තක් සඳහා සභා අරමුදලින් ගෙවීම් |

| | | |
|---|---|---|
| | | සිදුකර තිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 10 - 2023 නොවැම්බර් 03 දින) |
| (iv) 152(1) වගන්තිය | 12,000 | සභාව විසින් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් වූ බදු අය කිරීමට අදාළව බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ දුරකථන කුළුණු 02 කින් 2022 හා 2023 වර්ෂ සඳහා අයවිය යුතු රු.12,000 ක බදු මුදල අයකර<br><br>ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 03(අ) - 2023 නොවැම්බර් 03 දින) |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මු.රෙ.104 | | 2023 ඔක්තෝබර් 24 දින භෞතිකව පරීක්ෂා කරන ලද PF – 7889 දරන කැබ් රථයේ රියදුරු අසුන ළඟ පැති කණ්ණාඩියේ පිටුපස කවරය කැඩී තිබුණු අතර, මේ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(i) - ඡේදය : 02(ඇ) - 2023 නොවැම්බර් 03 දින) |
| (ii) මු.රෙ. 388 හා 389 | 1,498,152 | සභාව විසින් නිකුත් කරනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර ඇතුළත් කර ලේඛනයක් නඩත්තු කළයුතු වුවත්, සභාව විසින් නිකුත් කරන ලද රු.1,498,152 ක් වටිනා චෙක්පත් 26 ක් භාරගත් පාර්ශවයන්ගේ තොරතුරු ලේඛන ගතකර නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 12 - 2023 නොවැම්බර් 03 දින) |
| (ඇ) 2021 පළාත් සභා මූල්‍ය හා පරිපාලන රීති 476 හා 477 | - | සෑම වර්ෂයක් සඳහාම වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකල යුතු වුවත්, ඒ |

අනුව කටයුතු කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2002 මැයි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2002 | - | රජයේ වාහන වල ස්ථිරව රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම ප්‍රදර්ශනය කළයුතු වුවද, සභාව සතු වාහන 02 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(i) - ඡේදය : ඊ - 2023 නොවැම්බර් 03 දින) |
| (ඉ) | ජාතික පාරිසරික පනතේ 39 වගන්තිය | - | පරිසර බලපත්‍ර ලබා ගතයුතු ආයතන 04 ක් පැවතිය ද, ඒ සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි.<br><br>(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 08 (අ) - 2023 නොවැම්බර් 03 දින) |

## 2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ප්‍රාදේශීය සභා ලේකම්වරයා වෙත බල ප්‍රදේශය තුළ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වූ බලය එම පනතේ 19(1) වගන්තිය ප්‍රකාරව ලබා දී තිබුණි. එම බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ලේකම්වරයා වෙනුවෙන් දරන ලද වියදම් ගෙවනු ලැබිය හැකි බව එකී පනතේ 132(ච) උප වගන්තියේ සඳහන් වුවද, එයට අනුකූල නොවන පරිදි බල ප්‍රදේශයෙන් පිටත කාර්යාලය හා නිවස අතර දිනකට ගමන් වාර 04 ක් ගමන් කිරීම සඳහා ඉන්ධන වෙනුවෙන් රු.800,139 ක් ගෙවීම් කර තිබුණු අතර, එසේ ගමන් කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(xxxiii) ට අනුකූල නොවන පරිදි කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව සභා ලේකම්වරයා විසින් ගමන් පහසුකම් සලසාගෙන තිබුණි.

( SPLG/GL/A/KARPS/05/AQ/2023/16(i) - ඡේදය : 02 (ඊ) – 2023 නොවැම්බර් 03 දින)

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,020,062 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,352,864 ක් විය.

### 3.2 ආදායම් පරිපාලනය

### 3.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභා ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,168,798 | 4,741,920 | 5,108,424 | 5,620,998 | 3,578,798 | 2,955,934 | 3,219,079 | 5,987,502 |
| කුලී | 8,910,350 | 6,659,850 | 9,887,267 | 4,306,404 | 7,893,230 | 6,481,989 | 7,548,540 | 7,533,821 |
| බලපත්‍ර ගාස්තු | 450,100 | 422,597 | 398,597 | 149,350 | 400,100 | 172,935 | 172,935 | 125,350 |
| වෙනත් ආදායම් | 11,883,000 | 8,463,326 | 8,460,326 | 48,192 | 8,376,600 | 7,868,597 | 7,868,597 | 45,192 |
| | 25,412,248 | 20,287,693 | 23,854,614 | 10,124,944 | 20,248,728 | 17,479,455 | 18,809,151 | 13,691,865 |

### 3.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවියයුතු ආදායම රු.13,691,865 ක් විය. වර්ෂය තුළ බිල් කිරීම් රු.20,287,693 ක් වූ අතර, රැස් කළයුතු සමස්ථ ආදායම රු.33,979,558 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.23,854,614 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟය රු.10,124,944 ක් විය.

### 3.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ වරිපනම් හා බදු ආදායම රු.5,987,502 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.4,741,920 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.10,729,422 ක් වුවද, රැස් කළ ආදායම රු.5,108,424 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 48 ක් හා රු.5,620,998 ක හිඟයක් පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ ඒකක 1791 කින් රු.7,217,762 ක හිඟ ආදායමක් සභාව වෙත අය වීමට තිබූ නමුත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ තුළ 2023 වර්ෂය සඳහා කිසිදු බදු මුදලක් නොගෙවූ ඒකක 1127 ක් පැවති අතර, එම ඒකක වලින් අය වියයුතු හිඟ වරිපනම් ශේෂය රු.3,817,535 ක් විය.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ග්‍රාම නිලධාරී වසම් 40 ක් පැවති අතර, ඉන් වසම් 03 කින් පමණක් වරිපනම් බදු අය කිරීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි ග්‍රාම නිලධාරී වසම් 37 කින් ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්ති ප්‍රකාරව දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ වරිපනම් බදු ආදායම් බිල් කිරීම 2008 වර්ෂයේ සිදු කරනු ලබන වරිපනම් තක්සේරු වටිනාකම මත වන අතර දේපලවල වර්තමාන වටිනාකම් තක්සේරු කර ආදායම අය නොකිරීමෙන් සභාවට ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 02 (අ)(ආ)(ඇ) - 2023 නොවැම්බර් 03 දින)

### 3.2.4 කුලී

-----

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට අය වියයුතු බදු කුලී ආදායම රු.7,533,821 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.6,659,850 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.14,193,671 ක් වුවද, රැස් කළ ආදායම රු.9,887,267 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.4,306,404 ක හිඟයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 233 කින් කඩ කාමර 189 ක රු.6,344,460 ක මුදලක් හිඟව පැවති අතර, එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) මහජ්දණ්ඩ පොළ භූමියේ අංක 17 කඩ කාමරය 2018 ජූලි මස සිටම බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු.83,700 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) දංගහවිල සමන් සෙනෙවිරත්න ප්‍රජා කේන්ද්‍රයේ අංක 01 සහ 02 කඩ කාමරවලින් 2013 වර්ෂයට පෙර සිට රු.295,368 ක මුදලක් හිඟව පවතින අතර, එම හිඟ ශේෂ අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, නැවත එම කඩ කාමර බදු දී තිබුණි.

(ඉ) මහජ්දණ්ඩ පොළ භූමියෙහි කඩ කාමර 31 න් කඩ කාමර 22 ක් සමාලෝචිත වර්ෂයේ වසාදමා පැවති අතර, එම කඩ කාමර වසා තැබීමට හේතු පරීක්ෂා කර, ඊට පිළියම් යෙදීමට හා එම කඩ කාමරවලින් මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 වන වගන්තිය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවද, සභාව සතු කඩ කාමර 122 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(උ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 06 වන වගන්තිය අනුව වසර 05 කට වරක් තක්සේරු බදු මුදල නව තක්සේරුවක් මඟින් සංශෝධනය කළයුතු වුවද, අවසන් වරට තක්සේරුව 2015 වර්ෂයේ සිදුකර තිබූ අතර, සභාව කඩ කාමර 198 ක තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු නොකිරීමෙන් සභාවට ලැබිය යුතු කුලී ආදායම් අහිමි වී තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 02(අ)(ආ)ඇ)(ඈ)(ඉ)(ඊ)(උ)-
2023 නොවැම්බර් 03 දින)

(ඌ) ඌරගස්මංහන්දිය උප කාර්යාලයට අයත් සති පොළ බදු දීමට අදාළ අයවිය යුතු හිඟ මුදල රු.478,050 ක් හා අධි ගාස්තුව රු.99,225 ක් වූ අතර, මෙම හිඟ මුදල් අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 05 (ඉ) –
2023 නොවැම්බර් 03 දින)

**3.2.5 බලපත්‍ර ගාස්තු**

**---------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් බදු ගෙවිය යුතු ආයතන 14 කින් 2023 වර්ෂයේ දී අයවිය යුතු බදු මුදල් රු.18,460 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර හා වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 80 කින් බලපත්‍ර ගාස්තු රු.147,300 ක් අයකර ගැනීමට අදාළ තොරතුරු ලේඛන පරීක්ෂාවේ දී තහවුරු නොවී ය

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 04(අ)(ආ)(ඇ) - 2023 නොවැම්බර් 03 දින)

(ඇ) සභා සීමාව තුළ සවිකර ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 158 ක් වෙනුවෙන් රු.1,114,950 ක ගාස්තුවක් සමාලෝචිත වර්ෂය තුළ අය කරගෙන නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 05 - 2023 නොවැම්බර් 03 දින)

### 3.2.6 වෙනත් ආදායම්

------------------

(අ) සභාව සතු ක්‍රීඩා භූමි අවස්ථා 10 කදී කිසිදු ආදායමක් අය නොකර නොමිලේ ලබා දීමට සභාව කටයුතු කිරීමෙන් සභාවට රු.19,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 06 – 2023 නොවැම්බර් 03 දින)

(ආ) සභාව සතු ජල බවුසරය අවස්ථා 10 කදී සේවයේ යෙදවීමට අදාළව අයවිය යුතු රු.55,000 ක ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 07(අ)(ආ) – 2023 නොවැම්බර් 03 දින)

### 3.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.325,000 ක් හා මුද්දර ගාස්තු රු.9,332,054 ක් විය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඌරගස්මංහන්දිය ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින්ගෙන් හිඟ ජල ගාස්තු රු.1,148,760 ක් අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ජල මීටර් 139 ක් අක්‍රීය වී පැවති අතර, එම ජල මීටර් අළුතින් සවි කිරීමට කටයුතු නොකිරීම මත රු.8,950 ක ස්ථාවර ආදායමක් පමණක් මාසිකව සභාව උපයාගෙන තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 03 (අ)(ආ)- 2023 නොවැම්බර් 03 දින)

(ආ) 2023 ජනවාරි මස සිට අගෝස්තු 31 දින දක්වා ජල බදු බිල් කිරීම් රු.647,540 ක් වූ අතර, ජල ව්‍යාපෘතියේ විදුලි වියදම රු.905,540 ක් වී තිබුණි. ඒ අනුව ජල සේවා සැපයීමෙන් සභා අරමුදලට රු.258,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 03 (ඇ)- 2023 නොවැම්බර් 03 දින)

(ඇ) සභා බල ප්‍රදේශයේ වීථි පහන් 2200 ක් නඩත්තු කළ ද, වීථි පහන් කණු 1847 ක් අංක කර නොතිබුණු අතර, වීථි පහන් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 05(ඇ) - 2023 නොවැම්බර් 03 දින)

(ඈ) ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු අංක SD/HNT/2023/38 දරන ඉඩම් අනුබෙදුමට අදාළව පැවති ඇල ඉවුරේ සිට ගොඩබිම දෙසට මීටර් 6.5 ක් දුර ප්‍රමාණය රක්ෂිත සීමාව ලෙස තැබිය යුතු බව දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය සභාව වෙත දැනුම් දී තිබුණු අතර, ඉඩම පිළිබඳ ස්ථානීය පරීක්ෂාවේ දී එසේ රක්ෂිත සීමාවක් නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, උක්ත අනුබෙදුමට අදාළව පැවති පර්චස් 12.25 ක් වූ මාර්ග හා කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර නොතිබූ නමුත්, සභාව විසින් පූර්ව අධීක්ෂණයකින් තොරව අනු බෙදුම් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 11 (අ)(ආ) –
2023 නොවැම්බර් 03 දින)

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------
වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර අනුමත කර තිබුණ ද, ඇස්තමේන්තු වටිනාකම වන රු.950,000 ක් වන වැඩ යෝජනාවක් පමණක් සිදුකර තිබූ අතර, රු.18,086,704 ක් වූ වැඩ යෝජනා 10 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 15 - 2023 නොවැම්බර් 03 දින)

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------
සභාව විසින් මාසිකව දිරන කසළ ටොන් 45 පමණ ප්‍රමාණයකුත් නොදිරන කසළ ටොන් 15 පමණ ප්‍රමාණයකුත් සභා සීමාව තුළ එකතු කරනු ලබයි. නොදිරන කසළ මොන්රෝවියාවත්ත කසළ අංගනය වෙත භාර දෙන නමුත්, දිරන කසළ සභාවට අයත් නොවන ඉඩමකට දමා පස් දමා වසා දමනු ලබයි. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 94 වන වගන්තිය ප්‍රකාරව අපද්‍රව්‍ය සභාව සතු දේපලක් බවට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iv) - ඡේදය 13 - 2023 නොවැම්බර් 03 දින)

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) යක්කඩුව, ඇල්පිටිය යන ලිපිනයේ පදිංචි අය විසින් වර්ග මීටර් 602 ක තෙමහල් ගොඩනැගිල්ලක් යක්කටුව හන්දියේ ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා නියමිත ගොඩනැගිලි සීමාව තබා නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iii) ඡේදය 02(අ) - 2023 නොවැම්බර් 03 දින)

(ආ) උක්වත්ත යක්කටුව ලිපිනයේ පදිංචි අය විසින් එකී ස්ථානයේ වර්ග මීටර් 233 ක නව ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීමට අදාළ නියමිත ගොඩනැගිලි සීමාව තබා නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iii) ඡේදය 02(ආ) - 2023 නොවැම්බර් 03 දින)

(ඇ) සැලසුම් කමිටු තීරණ මඟින් BA/2022/HNT/02 දරන සංවර්ධන බලපත්‍රයට අනුමැතිය ලබා දී තිබුණු අතර මෙම ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලට යාබදව වර්ග මීටර් 421 ක අනවසර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iii) - ඡේදය 03 - 2023 නොවැම්බර් 03 දින)

(ඈ) සැලසුම් කමිටු තීරණ මඟින් BA/2023/HNT/02 දරන සංවර්ධන බලපත්‍රයට 2023 මැයි 08 දින අනුමැතිය ලබා දී තිබුණි. ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා නියමිත ගොඩනැගිලි සීමා තබා නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iii) - ඡේදය 04 - 2023 නොවැම්බර් 03 දින)

(ඉ) කරන්දෙණිය බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද මෙම අනවසර ඉදිකිරීම් 04 සම්බන්ධයෙන් සභාව විසින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම හා ආවරණ අනුමැතිය ලබාදිය හැකි ගොඩනැගිලි සම්බන්ධව රු.2,580,000 ක ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(iii) - ඡේදය 05 - 2023 නොවැම්බර් 03 දින)

## 4.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| තෘතීයික | 04 | 03 | 01 | - |
| ද්විතීයික | 31 | 31 | 04 | 04 |
| ප්‍රාථමික | 54 | 35 | 19 | - |
| | 89 | 69 | 24 | 04 |

සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඖෂධ සංයෝජක, විදුලි කාර්මික, ආදාහනාගාර ක්‍රියාකරු, ආදාහනාගාර සහය ක්‍රියාකරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු ඇතුළු වැදගත් සේවක පුරප්පාඩු 24 ක් පැවති අතර, ද්විතීයික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

### (ආ) සේවක ණය

වසර 09 ත් වසර 35 ත් අතර කාලයක සිට පැවත එන සේවක ණය ශේෂය රු.166,140 ක් විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 12.10 වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ ණය මුදල් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) **සේවකයන් රාජකාරිවල නිරතවීම**

---------------------------------------

සභාවේ සේවය කරනු ලබන ස්ථිර සේවකයන් 06 ක් හා අනියම් / ආදේශක සේවකයන් 03 ක් තම රාජකාරියට පරිබාහිරව රාජකාරීන් ඉටු කරනු ලබන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

( SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 09 - 2023 නොවැම්බර් 03 දින)

**4.4 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විදුලි තොග ලේඛන ශේෂය හා භෞතික ශේෂය අතර තොග අයිතම 09 ක ඒකක 496 කට අදාළව රු.1,363,723 ක වෙනසක් නිරීක්ෂණය විය.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 04 - 2023 නොවැම්බර් 03 දින)

(ආ) සභාව සතු අක්කර 01 රූඩ් 03 පර්චස් 21 ක් වූ ඉඩම් 08 ක් හා ප්‍රමාණය ඉදිරිපත් නොකළ ඉඩමක් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර, මෙම ඉඩම්වල වටිනාකම වෘත්තීය තක්සේරුකරුවෙකු මගින් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(v) - ඡේදය 08 - 2023 නොවැම්බර් 03 දින)

(ඇ) කුරුඳුගහ හැතැක්ම උප කාර්යාල භූමියේ පිහිටි වර්ග මීටර් 271.44 ක් තරම් වූ ගොඩනැගිල්ලේ තලාද තට්ටුව (slab) ප්‍රාදේශීය සභාව මගින් ඉදිකර තිබුණු අතර, ඒ සඳහා පියගැට පෙලක් ඉදිකර නොතිබුණි. කොන්ක්‍රීට් කණු හා තලාද තට්ටුව ඉදිකිරීමේ දී නියමිත හැඩයම් වැඩ (Form Work) මනාව නිම කර නොමැති බැවින් හොඳ නිමාවක් නොතිබුණි. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුගේ (වැ.බ.) අංක පපාකො/ගා/සං/01/01/15/2021 හා 2021.10.15 දිනැති ලිපිය මගින් දක්වා තිබූ පරිදි මෙම ඉදිකිරීමට අදාළව අත්තිවාරම් විස්තර, කම්බි හා ඉදිකිරීමට අදාළ සැලසුම් ආදිය පිළිබඳ තොරතුරු නොමැති බැවින් උඩුමහල සකස් කිරීම පිළිබඳ

තීරණය කිරීමට නොහැකිව තිබුණි. වට්නාකම හඳුනාගත නොහැකි 2001 වර්ෂයේ දී ඉදිකර තිබුණු මෙම ගොඩනැගිල්ල වසර 20 ට අධික කාලයක් පරිසරයට නිරාවරණය වී තිබීම නිසා තලාද තට්ටුව (slab) තෙතමනයට ලක් වී කොන්ක්‍රීට් දුර්වල වීමේ අවධානමක් ඇති බව නිරීක්ෂණය වූ අතර, වසර 20 ට අධික කාලයක සිට අඩක් නිමකර ඇති මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

( SPLG/GL/A/KARPS/05/AQ/2023/16(ii) - ඡේදය 04 (අ)(ආ)(ඇ) - 2023 නොවැම්බර් 03 දින)

**4.5 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

කර්මාන්ත 04 ට අදාළ ABC අතුරා සණවත් කිරීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු M1 – 013A මිල අනුපාතය භාවිතා කර තිබුණි. මෙම මිල අනුපාතය යටතේ පළල මීටර් 1.2 ට අඩු තීරු වශයෙන් (Strips) ABC අතුරා සණවත් කිරීම කළ යුතු වුවද, එසේ තීරු වශයෙන් සිදුකර නොතිබීම නිසා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු තීරු වශයෙන් (Strips) ABC ඇතිරීම අවශ්‍ය නොවන M1 – 012A ඝණ මීටරයට රු.805 මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා ඝණ මීටර් 35.83 ක් සඳහා රු.12,264 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(SPLG/GL/A/KARPS/05/AQ/2023/16(ii) - ඡේදය 02 (අ) - 2023 නොවැම්බර් 03 දින)

**05. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

--------------------------------------------

**5.1 අයවැය පාලනය**

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 02 ක රු.2,651**,**191 ක හිතකර විචලනයක් දක්නට ලැබුණ අතර, එම වට්නාකම සියයට 14 ත් සියයට 62 ත් අතර පරාසයක විය.

(ආ) වියදම් විෂයයන් 07 ක එකතුව රු.29,292**,627** ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට 07 ත් සියයට 77 ත් අතර පරාසයක විය.

(ඇ) ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම්වල එකතුව රු.37,794,502 ක් වූ අතර, එම වටිනාකම සියයට 06 සිට සියයට 67 දක්වා පරාසයක විය.

(විස්තරාත්මක තොරතුරු ඇමුණුමෙහි දැක් වේ.)

**5.2 අභ්‍යන්තර විගණනය**

--------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (ද.ප) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපප/යහ/01/නා.ව.ලෙ. දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතු වුවද, අභ්‍යන්තර විගණන නිලධාරියකු පත් කර තිබුණ ද, අභ්‍යන්තර විගණන රාජකාරි නිසි ලෙස ඉටු වී නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. එමෙන්ම වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඊට අනුකූල වන පරිදි අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

විගණකාධිපති.

ඇමුණුම

----------

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පිළිබඳ විස්තර - ඡේදයට යොමුව : 5.1

| **ආදායම** | **ඇස්තමේන්තුව** | **සත්‍ය** | **විචලනය** | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 4,168,798 | 4,741,920 | 573,122 | 14 |
| කුලී | 8,910,350 | 6,659,850 | (2,250,500) | 25 |
| බලපත්‍ර ගාස්තු | 450,100 | 422,597 | (27,503) | 6 |

| | | | | |
|---|---|---|---|---|
| සේවා සඳහා ගාස්තු | 5,798,000 | 1,937,691 | (3,860,309) | 67 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 3,325,000 | 5,403,069 | 2,078,069 | 62 |
| වෙනත් ආදායම් | 31,260,000 | 19,177,467 | (12,082,533) | 39 |
| ආදායම් ආධාර | 60,801,793 | 41,228,136 | (19,573,657) | 32 |
| **වියදම** | | | | |
| **-------** | | | | |
| වැටුප් හා දීමනා | 60,501,793 | 47,109,798 | 13,391,995 | 22 |
| ගමන් වියදම් | 1,142,000 | 702,962 | 439,038 | 38 |
| සැපයුම් හා උපකරණ | 19,200,000 | 17,800,512 | 1,399,488 | 7 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 9,142,500 | 5,172,210 | 3,970,290 | 43 |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 5,433,000 | 3,915,846 | 1,517,154 | 28 |
| ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 10,795,000 | 2,516,070 | 8,278,930 | 77 |
| විශ්‍රාම වැටුප් | 630,000 | 334,268 | 295,732 | 47 |